# මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
# 2022/2023
# ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මේ සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකි ය.

**සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

2022.11.30 වන දිනට වයස අවුරුදු 45 ට අඩු වීම.

අ. පො. ස. (උ. පෙළ) විෂය 3කින් සමත් වීම.

**බඳවා ගැනීමේ ක්‍රමය**

සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

එක් අවුරුදු පාඨමාලාවකි.

**පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්තු**

ලියාපදිංචි වීමේ දී රුපියල් 1000ක් ගෙවිය යුතු අතර පාඨමාලා ගාස්තුව වන රුපියල් 30,000 වාරික තුනකින් ගෙවිය හැකි ය.

සතියේ දිනවල හා සති අන්තවල දේශන සහ ක්‍රියාකාරකම් පැවැත්වේ. අධ්‍යයන පැවරුම් හා ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවකින් ද යුක්ත ය.

මෙම පාඨමාලාවට බඳවා ගනු ලබන්නේ සීමිත සංඛ්‍යාවක් පමණි. ඉල්ලුම්කරු විසින් සිය ජීව දත්ත ඇතුළත් වන ලෙස සකස් කර ගත් ඉල්ලුම්පත්‍රයක් 2022.11.30 දිනට පෙර **අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ **මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023** යනුවෙන් සඳහන් කරන්න.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.
**www.nie.lk**